00084

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුව
සමාජ විද්‍යා උසස් සහතික පත්‍ර පාඨමාලාව - 2024/2025
1 වන මට්ටම - දෙවන වර්ෂාර්ධය
අවසන් පරීක්ෂණය
**DSC1714** - නීතිය පිළිබඳ සංකල් හා අවබෝධය

---

දිනය : 2025 අගෝස්තු 03 කාලය :පෙ.ව 9.30 - ප .ව 12.30

---

මුළු ප්‍රශ්න ගණන 09 යි
ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න
**I** කොටසේ ඇති ප්‍රශ්නවලට සහ **II** කොටසේ ඇති ඕනෑම ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න

**I කොටස - මෙම ප්‍රශ්නය අනිවාර්ය වේ.**

**01.** පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. සමාජයට නීතිය වැදගත් වන්නේ ඇයි? එහි කාර්යභාරය සහ වැදගත්කම පැහැදිලි කරන්න.

ii. නීතියේ ආධිපත්‍යය පිළිබඳ සංකල්පය කුමක්ද? ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක එහි මූලධර්ම සහ වැදගත්කම සාකච්ඡා කරන්න.

iii. ශ්‍රී ලංකා නීති රාමුව තුළ ඔබ හඳුනාගෙන ඇති ප්‍රධාන ගැටළු හෝ අභියෝග මොනවාද?

iv. ශ්‍රී ලංකා නීති රාමුව තුළ ඇති ගැටළු විසඳීම සඳහා ඔබට යෝජනා කළ හැකි යෝජනා හෝ විසඳුම් මොනවාද?

**(ලකුණු 5 x 4 = 20)**

**II කොටස - මෙම කොටසේ ඇති ඕනෑම ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

**02.** "බොහෝ විට විවිධ ප්‍රජාවන් හෝ ජාතික කණ්ඩායම් නියෝජනය කරන බහු නීති සම්ප්‍රදායන්, තනි රටක් තුළ එකවර ක්‍රියාත්මක වන විට බහුවිධ නීති පද්ධතියක් ඇති වේ."

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? ශ්‍රී ලංකා නීති පද්ධතිය කෙරෙහි අවධානය යොමු කරමින්, එහි විවිධ පුද්ගලික සහ සාමාන්‍ය නීතියෙහි ආරම්භය, අදාළ කිරීම සහ අන්තර්ක්‍රියා සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

**03.** "යුක්තිය පසිඳලීමේදී අධිකරණ පද්ධතිය වැදගත් කාර්යභාරයක් ඉටු කරයි".
මෙම ක්‍රියාවලියට සම්බන්ධ ශ්‍රී ලංකාවේ විවිධ අධිකරණ හඳුනාගෙන එක් එක් අධිකරණයේ අධිකරණ බලය සහ කාර්යයන් සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

**04.** පහත සංකල්ප සාකච්ඡා කරන්න.

i. පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය පිළිබඳ සංකල්පය. මෙම මූලධර්මය ව්‍යවස්ථාදායකය සහ රජයේ අනෙකුත් ශාඛා අතර සම්බන්ධතාවයට බලපාන්නේ කෙසේද? ඔබේ පිළිතුර සඳහා උදාහරණ සපයන්න.

ii. බලතල වෙන් කිරීමේ මූලධර්මය සහ සමබර රජයක් පවත්වාගෙන යාමේදී එහි වැදගත්කම. ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා රාමුව තුළ මෙම මූලධර්මය ක්‍රියාත්මක වන ආකාරය උදාහරණ සමඟ දක්වන්න.

(ලකුණු 10 x 2 = 20)

**05.** ශ්‍රී ලංකාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ ඔබේ දැනුම භාවිතා කරමින් පහත සඳහන් සිදුවීම් වලදී උල්ලංඝනය වී ඇති මූලික අයිතිවාසිකම් සාකච්ඡා කරන්න.

i. රජයේ පාසල් ගුරුවරයකු වන අරුණ, වෙනත් ආගමකට හැරී පාසලේදී එම ආගමික සංකේත පැළඳීමට පටන් ගත්තේය. ඒවා ඉවත් කරන ලෙස හා විනය ක්‍රියාමාර්ග ගන්නා බව විදුහල්පතිවරයා ඔහුට පැවසීය.

ii. චමින්ද ප්‍රශ්න කිරීම සඳහා පොලිස් භාරයට ගන්නා ලදී. අත්අඩංගුවේ සිටියදී, පාපොච්චාරණයක් කරනලෙස නිලධාරීන් ඔහුට පහර දුන්හ.

iii. සුදුසුකම් ලත් අයදුම්කරුවෙකු වන ශානිකා සුළුතර ජනවාර්ගික කණ්ඩායමකට අයත් වීම නිසා රජයේ ශිෂ්‍යත්වයක් ලබා දීම ප්‍රතික්ෂේප කරන ලදී.

iv. විරෝධතාවයක් අතරතුර හේතුවක් නොදන්වා රවී අත්අඩංගුවට ගෙන දින කිහිපයක් රඳවා තබා ගන්නා ලද අතර විනිසුරුවරයෙකු ඉදිරියටද ඉදිරිපත් කර නැත.

v. නිසංසලා රජයේ ප්‍රතිපත්ති විවේචනය කරමින් සමාජ මාධ්‍ය තුළ වීඩියෝවක් පළ කළේය. පසුව පොලිසිය ඇයට වීඩියෝව මකා දැමීමට හා නැතහොත් අත්අඩංගුවට ගැනීමට සිදුවන ලෙස අනතුරු ඇඟවීය.

(ලකුණු 4 x 5 = 20)

**06.** සේවා ස්ථානවල කාර්මික ආරවුල් විසඳීම සඳහා 1950 අංක 43 දරන කාර්මික ආරවුල් පනත යටතේ සපයා ඇති ක්‍රම සාකච්ඡා කරන්න.

**(ලකුණු 20)**

**07.** ගිවිසුම් නීතිය පිළිබඳ ඔබේ දැනුම භාවිතා කර පහත සිදුවීම්වල නීතිමය වලංගුභාවය සාකච්ඡා කරන්න

**i.** නිමල් වයස අවුරුදු 17 ක් වන අතර ඔහුගේ යතුරුපැදිය ඔහුගේ මිතුරා වන රුවන්ට රු. 150,000 කට විකිණීමට එකඟ වේ. රුවන් මුදල් ගෙවයි, නමුත් පසුව නිමල් බයිසිකලය භාර දීම ප්‍රතික්ෂේප කරයි.

**ii.** තහනම් කරන ලද භාණ්ඩ රට තුළට ගෙන ඒමට සුනිල්ට උදව් කළහොත් රු. 50,000 ක් ගෙවීමට ආශා එකඟ වේ. පසුව, ආශා ගෙවීම ප්‍රතික්ෂේප කරයි.

**iii.** විශ්‍රාමික පියෙක් තම දේපළ තම පුතාට පැවරීමේ ඔප්පුවකට අත්සන් කරයි. එසේ කරන්නේ අත්සන් නොකළහොත් ඔහුව රැකබලා ගැනීම නවත්වන බවට ඔහුගේ පුතා තර්ජනය කළ නිසාවෙනි.

**iv.** රවී, කුමාර්ට පැවසුවේ පාවිච්චි කළ මෝටර් රථය කිසිදා අනතුරකට ලක්ව නොමැති බවය, කුමාර් එම ප්‍රකාශය මත පදනම්ව එය මිලදී ගත් අතර. පසුව, කුමාර්ට දැන ගැනීමට ලැබුණේ මෝටර් රථයට පෙර බරපතල හානි සිදුවී ඇති බවයි.

**v.** තරංග තම ලැප්ටොප් පරිගණකය රු. 80,000 කට නදීෂාට විකිණීමට ලිඛිත යෝජනාවක් යැවීය. නදීෂා ලිපිය කියවා පිළිගැනීමට තීරණය කළ නමුත් තරංගට කිසි විටෙකත් දැනුම් දුන්නේ නැත.

**(ලකුණු 4 x 5 = 20)**

**08.** ශ්‍රී ලංකාවේ පවුල් නීතිය පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා පුවත්පත් ලිපියක් ලිවීමට ඔබට ආරාධනා කර ඇත. ශ්‍රී ලංකාවේ පවුල් නීතියේ ප්‍රධාන අංශ ආවරණය වන පරිදි ව්‍යුහගත තොරතුරු සහිත ලිපියක් සකස් කරන්න.

ඔබේ ලිපියේදී, විවාහය, දික්කසාදය, නඩත්තුව සහ භාරකාරත්වයට අදාළ ප්‍රධාන නීතිමය විධිවිධාන පැහැදිලි කරන්න. මෙම ක්ෂේත්‍රයේ නීතිමය අභියෝග හෝ ප්‍රතිසංස්කරණ ඉස්මතු කර නූතන සමාජයක පවුල් අයිතිවාසිකම් වඩා හොඳින් ආරක්ෂා කිරීමට නීතියට හැකි ආකාරය යෝජනා කරන්න.

**(ලකුණු 20)**



29

**09.** පහත සඳහන් කරුණු පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. නීති මූලාශ්‍ර

ii. පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

iii. රැකියා වර්ග

iv. වලංගු විවාහයක් සඳහා අවශ්‍යතා

**(ලකුණු 5 x 4 = 20)**

- *හිමිකම් ඇවිරිණි* -